සැ. යු.-මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2013 වර්ෂයට අදාළ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ නාමාවලිය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පළවේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,888 - 2014 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා - 2014.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

	පිටුව		පිටුව
තනතුරු - ඇබෑර්තු	1944	විභාග, විභාග ප්‍රතිඵල ආදිය	1946

සැ. යු.- ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත, 2014 ඔක්තෝබර් මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 නොවැම්බර් මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 නොවැම්බර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1941- B 80889—2,875 (2014/11)
B1-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

- (i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
- (ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
- (iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
- (vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

තනතුරු — ඇබෑර්තු

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීම - 2014

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ පුරප්පාඩු පවතින ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් 2014.01.01 දිනට සපුරාලන සුදුස්සන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් ඉහළ කෙලවරේ "ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තව ද බඳවා ගැනීමේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලවලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළවලට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2014.11.30 දින වේ.

සටහන.—ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :*

2014.01.01 දින වනවිට ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ සඳහන් සියළුම සුදුසුකම් සපුරා ඇත්තාවූ ද, අවසාන උපාධි (ආයුර්වේද/සිද්ධ/යුනානි) පරීක්ෂණයෙන් සමත්ව ඇත්තා වූ ද, මේ දක්වා රාජ්‍ය සේවයේ පත්වීම් නොලැබී ඇත්තාවූ ද, මුල්ම කණ්ඩායමේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ සියළුදෙනා අවසාන උපාධි පරීක්ෂණයේ දී එක් එක් තැනැත්තා ලබාගෙන ඇති ලකුණු පිළිවෙල මත පදනම් වූ කුසලතා අනුපිළිවෙලත්, අනුමත සේවක සංඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීමෙන් පසුව අනුගාමී වර්ෂවල සෙසු කණ්ඩායම්වල ආයුර්වේද/සිද්ධ/යුනානි උපාධිධාරී වෛද්‍යවරුන් ඔවුන් විභාග සමත් වූ වර්ෂ අනුපිළිවෙලින් ඉහත සඳහන් කුසලතා පදනම මත අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වන සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට සුදුසුකම් සනාථ කරගැනීමෙන් පසු තෝරාගනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමෙන් පසු උසස් කිරීම් සිදුකරනුයේ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට අනුකූලව ය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන හා ඊට අනුශාංගික වන චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම පත්වීම් භාරගත් දින සිට වර්ෂ පහක් ඉකුත්වීමට පෙර, රජයේ ප්‍රතිපත්ති වලට අනුරූපව රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබාගත් බව සනාථ කළ යුතුවේ. තව ද මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලුයේ ඉංග්‍රීසි භාෂාවෙන් නම් අභිමතය පරිදි රාජ්‍ය භාෂාව වශයෙන් සිංහල හෝ දෙමළ යන භාෂා දෙකෙන් එක් භාෂාවක ප්‍රවීණතාව පත්වීමේ දින සිට වසර 3ක් එනම් පරිවාස කාලය ඇතුළත ද, අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාවය පත්වීම් දින සිට වසර 5 ක් ඇතුළත ද ලබාගත යුතුවේ.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-2-2006 රු. 25,515-4x645-8x650-16x1050-රු. 50,095 (මාසික) වැටුප් පරිමාණය හිමි වේ. (එම වැටුප් පරිමාණයේ දෙවන වැටුප් පියවර වන රු. 26,160 ක් ආරම්භක වැටුප් පියවර වේ.)

04. *වයස් සීමාව :*

2014.01.01 දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතු ය.

05. *සුදුසුකම් :*

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :-

පිළිගත් විශ්වවිද්‍යාලයක ආයුර්වේද/සිද්ධ/යුනානි වෛද්‍ය විද්‍යාව පිළිබඳ පස් අවුරුදු පාඨමාලාවක් හදාරා, එක් අවුරුදු සීමාවාසික පුහුණුවක් සම්පූර්ණ කර ලබාගත් උපාධියකින් පසු ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිවූ වෛද්‍යවරයෙකු වීම.

5.1 *කායික සුදුසුකම් :*

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,
(ii) තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික, මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.2 *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) 2014.01.01 දින වනවිට තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. සම්මුඛ පරීක්ෂණය :
සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :—

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් අනුමත කරනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී

සියළුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම හෝ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉල්ලා සිටින විටෙක ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානම්ව සිටිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය,
(ii) උපාධි සහතිකය,
(iii) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය,
(iv) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය,
(v) ජාතික හැඳුනුම්පත.

08. ඉදිරිපත් කළයුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළයුතු අතර, අංක 01 සිට 09 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, අංක 10 සිට 11 තෙක් ශීර්ෂ දෙවන පිටුවටද ද වන ලෙස ගෙන සකස් කළයුතු බවත් ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාල ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

වී. බී. පී. කේ. වීරසිංහ,
ලේකම්,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශ.

2014 ඔක්තෝබර්,
එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුර

01. I (අ) අගට යෙදෙන නම මුලකුරු සමග (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) අගට යෙදෙන නම මුලකුරු සමග (සිංහලෙන්/දෙමළෙන්) :————.
II (අ) මුලකුරුවලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) මුලකුරුවලින් කියවෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. I ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ලිපි එවනු ලබන්නේ මෙම ලිපිනයටය.) :————.

II දුරකතන අංකය :————.

03. I උපන්දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

II 2014.01.01 දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐
(අදාල කොටුවේ x ලකුණ යොදන්න.)

05. විවාහකද/අවිවාහකද යන වග : විවාහක ☐ අවිවාහක ☐
(අදාල කොටුවේ x ලකුණ යොදන්න.)

06. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග :————.

07. ජාතිය :————.

08. ස්ථිර පදිංචි ස්ථානය අයත් :
(i) පළාත් සභාවේ :————.
(ii) දිස්ත්‍රික්කය :————.
(iii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

09. ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

10. අධ්‍යාපන සුදුසුකම් :
උපාධිය පිළිබඳ විස්තර :—

බී. ඒ. එම්. එස්. (BAMS) ☐ බී. යූ එම්. එස්. (BUMS) ☐ බී. එස් එම්. එස්. (BSMS) ☐

(අදාල කොටුවේ x ලකුණ යොදන්න.

1. විශ්ව විද්‍යාලය/ආයතනය :————.
2. උපාධිය වලංගු වන දිනය :————.
3. පන්තිය :————.
4. උපාධිය සම්පූර්ණ කළ මාධ්‍යය :————.
5. ප්‍රායෝගික පුහුණුව ලැබූ වර්ෂය :————.

11. ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය පිළිබඳ විස්තර :

1. අංකය :————.
2. වර්ෂය :————.

මෙම ඉල්ලුම් පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද මම මෙයින් සනාථ කරමි. මා ආයුර්වේද වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීමෙන් පසුව මෙහි ඇතුළත් යම් විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව පත්වීම් බලධාරියාට අනාවරණය වුවහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, කිසියම් වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන .... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

—————,
අත්සන සහතික කරන නිලධාරියාගේ,
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :—————.

ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඔහු/ඇයගේ වැඩ, සහ හැසිරීම .... බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකිය/නොහැකිය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිලමුද්‍රාව

දිනය :—————.

11-139

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 දෙසැම්බර් මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ඔක්තෝබර් මස 23 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*	*ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර*	*ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය*
ගම්පහ	ජා-ඇල	දකුණු අළුත්කුරු කෝරළය කොට්ඨාසයේ රාගම ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ.

11-181

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014

1.0 ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් සහ පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 2015 පෙබරවාරි මාසයේ දී පවත්වනු ලබනු බවත් ඒ සඳහා අයදුම්පත් කැඳවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවලදී පමණක් පැවැත්වේ. එම නගරවලට අදාළ නගර අංක පහත වගුවේ දැක්වේ. ඉල්ලුම් පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතු වේ. ඉල්ලුම් කළ නගරය/ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ඉහත සඳහන් යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයදුම්කරුවන් යොමු කෙරෙනු ඇත.

තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් විභාගය කොළඹදී පමණක්

පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

නගරය	නගර අංකය
කොළඹ	01
මහනුවර	02
ගාල්ල	03
මාතර	04
යාපනය	05
මන්නාරම	06
මුලතිව්	07
ත්‍රිකුණාමලය	08
මඩකලපුව	09
කුරුණෑගල	10
අනුරාධපුර	11
බදුල්ල	12
රත්නපුර	13
කිලිනොච්චි	14

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්, විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 සුදුසුකම් - 2010.09.29 දින සිට ක්‍රියාත්මක ග්‍රාම නිලධාරි බඳවා ගැනීමේ පටිපාටිය අනුව ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

5.0 *විභාග පටිපාටිය :* අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

	විෂය	*විෂය අංකය*	*ලකුණු*	*කාලය*
1.	කාර්යාල ක්‍රම හා ගිණුම්	01	100 යි	පැය 02 යි
2.	විෂයානුබද්ධ වෘත්තීය දැනුම	02	100 යි	පැය 02 යි
3.	පරිගණක පරීක්ෂණය	03	100 යි	පැය 01 1/2යි

5.1 කාර්යාල ක්‍රම හා ගිණුම් (විෂය අංකය - 01)

කාර්යාල ක්‍රම :

ග්‍රාම නිලධාරි කාර්යාලයේ හා රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ විෂයානුබද්ධ කරුණු සම්බන්ධව වාර්තාවක් කෙටුම්පත් කිරීමේ හැකියාවද පරීක්ෂා කෙරේ.

ගිණුම් :

ග්‍රාම නිලධාරි වෙත පැවරී ඇති රාජකාරිවලට අදාළ හා රජයේ කාර්යාලවල භාවිත වන මූලික ගිණුම් හා ගිණුම් ක්‍රම ද මුදල් පාලන පොත්වල කාර්යයන්, ප්‍රසම්පාදන පිළිබඳව ද අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ.

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.
(ලකුණු 25යි)

II වන කොටස - ප්‍රශ්න තුනකින් සමන්විත ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75යි)

5.2 විෂයානුබද්ධ වෘත්තීය දැනුම (විෂය අංකය - 02)

ග්‍රාම නිලධාරීන්ට අදාළ විවිධ අණපනත් හා අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් රජයේ ව්‍යවස්ථාපිත ආයතන මගින් පැවරී ඇති රාජකාරි පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.
(ලකුණු 25යි)

II වන කොටස - ප්‍රශ්න තුනකින් සමන්විත ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75යි)

5.3 පරිගණක පරීක්ෂණය (විෂය අංක - 03)

අයදුම්කරුට පහත සඳහන් හැකියාවන් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ.

තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප,
මෙහෙයුම් පද්ධති,
ගොනු කළමනාකරණය.

වදන් සැකසුම — මූලික කුසලතා, තිරයට හුරුවීම, පාඨ සංස්කරණය, පාඨ එකේලි කිරීම, අකුරු වර්ග හා උප ලක්ෂණ, අනුඡේද, ඡේද, පේළි අතර පරතරය වෙනස් කිරීම, පිම් අනුයෝගය (Tab Settings), පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය, අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද,

තිරු යෙදීම, පිටුව සැකසීම,
ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය,
අනුපිළිවෙළට සැකසීම,
ගොනු කළමණාකරණය,
ලේඛනයක් ලිපිනයන් කිහිපයකට යැවීමට සැකසීම,
මැක්‍රෝ භාවිතය,

පැතුරුම් පත්	මූලික කුසලතා, ආකෘතිකරණය (Formatting), සංස්කරණය, තීරු හා පරාස, නව ඇතුලත් කිරීම් හා ඉවත් කිරීම්, දත්ත අනුපිළිවෙළට සැකසීම, ප්‍රස්තාර සැකසීම, මුද්‍රණය, @ ශ්‍රිත (@ Functions) මැක්‍රෝ භාවිතය, ගොනු කළමනාකරණය
දත්ත සමුදාය	හැඳින්වීම, මූලික කුසලතා, දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය, ආකෘති, සන්ධානගත ආකෘති, උත්පතන ආකෘති (popup forms) විමසුම් (queries) අනුපිළිවෙළට සැකසීම, වාර්තා ලබා ගැනීම, මැක්‍රෝ භාවිතය,
ඉදිරිපත් කිරීම් / චිත්‍ර සටහන්	මූලික කුසලතා, සංස්කරණය, ආකෘතිකරණය, සැලසුම් යෙදීම, අනුරූප, පසුරු සිත්තම් හා ප්‍රස්තාර නිවේශනය, කදා මාරුව හා සජීවකරණය, ඉදිරිපත් කිරීමේ මෙවලම් භාවිතය, ගුරු (Master) කදාව සැකසීම, කදා මුද්‍රණය හා සටහන්,
අන්තර්ජාලය	අන්තර්ජාලය හැඳින්වීම, විශ්ව විසිරි ජාලය, මං සොයන ආකාරය, ව්‍යවහාරික අන්තර්ජාලය
විදුලි තැපෑල (E-Mail)	හැඳින්වීම, මූලික කුසලතා, විදුලි තැපෑල ලබා ගැනීම, විදුලි තැපෑල යැවීම හා ඊට ප්‍රතිචාර දැක්වීම. ඇමුණුම් භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය, පණිවුඩ සම්පාදනය,

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වැනි කොටස - බහුවරණ/ කෙටි පිළිතුරු ප්‍රශ්න 40 කින් යුක්ත වේ. (ලකුණු 40 යි)

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 05 කි. (ලකුණු 60 යි)

I හා II යන කොටස් දෙකටම නියමිත කාලය පැය 1 1/2 කි.

සටහන.—2010 -09-29 දිනැති ග්‍රාම නිලධාරි බඳවා ගැනීම් පටිපාටියේ ඇමුණුම් 02 හි 08 වැනි ඡේදයට අනුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක මෙහෙයුම් බලපත්‍රය හෝ පරිගණක මෙහෙයුම් බලපත්‍රයට සමාන හෝ ඊට ඉහළ ගුණාත්මක අගයක් ඇති තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනවලින් නිකුත් කරන ලද පරිගණක පිළිබඳ සහතිකපත්‍ර ලබා ඇති නිලධරයන් මෙම පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ. තවද ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක යෙදවුම් සහායක (NVQ මට්ටම 3) සහතිකය ලබා ඇති නිලධරයන් මෙම පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

6.0 සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුලත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් රාජ්‍ය භාෂාවකින් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින්වත් ලබාගත යුතු වේ.සියලු විෂයයන් සමත් වී විභාගය සම්පූර්ණ කරනු ලබන වර්ෂයේ විභාගය පවත්වන ලද අවසාන දිනය මෙම කාර්යක්ෂමතා කඩ ඉම සමත් වූ දිනය ලෙස සලකනු ලැබේ.

8.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් මා වෙත නිකුත් කරන අතර විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් අයදුම්කරුවන්ට දැන්වීමට කටයුතු කරනු ඇත.

9.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් තම සේවා වසමට අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා මඟින් 2014 දෙසැම්බර් මස 05 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

10.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* - අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

II වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අනන්‍යතාව විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11.0 *අයදුම්පත්‍ර.*—ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 5.0 දක්වා ඡේදයන් පළමුවන පිටුවට ද 6.0 සහ 7.0 දෙවන පිටුවට ද ඇතුළත් වන පරිදි "ඒ 4"ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක්

අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12.0 පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු.400/- ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු.200/- ක් ද වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයදුම්කරුගේ නමින්ම ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

13.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

14.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

15.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවන අතර මෙම විභාග නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති මෙම විෂයට අදාළ කවර කරුණක් පිළිබඳ වුවද මාගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2014 ඔක්තෝබර් මස 23 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ග්‍රාම නිලධාරි සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014

EFFICIENCY BAR EXAMINATION AND A WRITTEN TEST IN COMPUTER SKILLS FOR THE OFFICERS IN CLASS III OF GRAMA NILADHARI SERVICE - 2014

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

	විභාගයට ඉල්ලුම් කරන නගරය	නගර අංකය
පළමු තේරීම දෙවන තේරීම		

(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

(ගැසට් නිවේදනයේ 2.0 ඡේදයට අනුව විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර කැමැත්ත අනුව අනුපිළිවෙලින් දක්වන්න.)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ :-
GUNAWARDHANA, M. G. B. S. K.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/ දෙමළෙන්)

2.0 2.1 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 අයත් වන දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 අයත් වන දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————. (සිංහලෙන්/ දෙමළෙන්)

3.0 3.1 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

3.2 ස්ත්‍රී/ පුරුෂභාවය : [ ]

ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.3 උපන් දිනය :-

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

4.0 ඔබ මෙවර විභාගයේදී ඉදිරිපත් වන විෂයය/ විෂයයන් (ගැසට් නිවේදනයේ 05 වැනි ඡේදය බලන්න)

අනු. අංකය	විෂයය	විෂය අංකය
01		
02		
03		

5.0 5.1 අයත් වන ශ්‍රේණිය :————.
5.2 තනතුර :————.
5.3 අදාළ ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.
5.3 දුරකථන අංකය :————.

6.0 සැලකිය යුතුයි :- ගැසට් පත්‍රයේ දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල් ගෙවූ බවට දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අයදුම්කරුගේ නමින්ම ලබා ගත් කුවිතාන්සිය මෙහි නොගැලවෙන සේ ඇලවිය යුතුය.

[ ]

කුවිතාන්සි අංකය :————.

දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

දිනය :————.

මුදල රුපියල් :————.

7.0 ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. එසේම එම විභාගය සඳහා පළමුවරට ඉදිරිපත් වන බව ද/ විභාගයට නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය

………… ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ………… ග්‍රාම නිලධාරී වසමේ සේවයේ නියුතු ග්‍රාම නිලධාරී/ ග්‍රාම නිලධාරිනී, …………………… මහතා/ මහත්මිය/ මෙනෙවිය විසින්,

(i) මා ඉදිරියේදී අත්සන් කළ බවත්,
(ii) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
(iii) නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,
(iv) පළමුවන වරට විභාගයට පෙනී සිටින බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවන ලද ලදුපත අලවා ඇති බවත්, මම සහතික කරමි.

(නොගැලපෙන වචන කපා හරින්න)

————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන
සහ නිලමුද්‍රාව.

නම :————.

පදවි නාමය :————.

ලිපිනය :————.

දිනය :————.

11-160

ශ්‍රී ලංකා කාර්මික පුහුණු ආයතනය

දියගල ළමා නගරය - රාගම

නවක සිසුන් බඳවා ගැනීම - 2015 වර්ෂය

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි සහ පුණ්‍ය ආයතනයක් වශයෙන් රජයේ ලියාපදිංචි දියගල ළමා නගරයට නවක සිසුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. පහත සඳහන් පරිදි පාඨමාලා සඳහා ඔබට අයදුම්කල හැක.

පූර්ණ කාලීන පාඨමාලා :

අංකය	පාඨමාලාවේ නම	අවම සුදුසුකම්	කාලය	වයස
01	බේකරි (සංචාරක හෝටල්) ශිල්පය	අ. පො. ස. සා/පෙළ දක්වා	මාස 06	අවු 17 ත් අවු 25 ත් අතර
02	විදුලි මෝටර් එතීම	අ. පො. ස. සා/පෙළ දක්වා	මාස 06	
03	යාන්ත්‍රික ශිල්පය	අ. පො. ස. සා/පෙළ	මාස 12	
04	පැස්සුම් ශිල්පය	අ. පො. ස. සා/පෙළ පෙනී සිටීම	මාස 12	
05	විදුලි ශිල්පය	අ. පො. ස. සා/පෙළ	මාස 12	
06	Cook	අ. පො. ස. සා/පෙළ දක්වා	මාස 12	
07	House Keeper	(මෙම පාඨමාලා තුනම		
08	Steweard	එකවර හැදෑරිය හැක)		

නේවාසික පාඨමාලා :

අංකය	පාඨමාලාවේ නම	පාඨමාලාවේ කාලය	අවම සුදුසුකම්
01	යාන්ත්‍රික ශිල්පය	අවුරුදු 4 (NVQ)	පාසල් අධ්‍යාපනය
02	පැස්සුම් ශිල්පය	අවුරුදු 4 (NVQ)	අතර මග නවතාගත් වයස අවු. 15 - 18
03	විදුලි ශිල්පය	අවුරුදු 4 (NVQ)	අතර පිරිමි දරුවන්ට
04	සංචාරක හෝටල් ක්ෂේත්‍රය	අවුරුදු 4	අයදුම් කල හැක.
05	වඩු කාර්මික	අවුරුදු 4	

සති අන්ත පාඨමාලා සඳහා :

01 කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව අවුරුදු 02කි.
සුදුසුකම් - උසස් පෙළ විෂයයන් 02ක් සමත්වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරත වීම.

පාඨමාලා ගාස්තු මසකට රු. 3,000 කි.

පුහුණුවත් සමග ඔබට :

1. (NVQ) ඩිප්ලෝමා, උපාධි මට්ටමට යෑමේ අවස්ථාව,
2. නිපුණතා පාදක ක්‍රමය යටතේ (C. B. T.) පාඨමාලා හැදෑරීමට අවස්ථාව,
3. වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය,
4. නායකත්ව පුහුණුව හා පෞරුෂ සංවර්ධනය.

පුහුණුවෙන් පසු :

1. දේශීය විදේශීය රැකියා අවස්ථා,
2. ලොවම පිළිගත් NVQ සහතිකය,
3. දීමනාවක් සහිත වැඩිදුර පුහුණුව,
4. උසස් පුහුණු අවස්ථා.

ඉහත විස්තර අනුව ඔබ කැමති පාඨමාලාවක් සඳහන් කර නම, ලිපිනය, අධ්‍යාපන සුදුසුකම් සහිත ඔබේ දුරකතන අංකය ද සඳහන් කොට ඔබ විසින් සකසාගත් අයදුම්පතක් 2014.12.22 වැනි දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. නැතහොත් පැමිණ විමසන්න.

කේ. මිල්ටන්,
පාඨමාලා සම්බන්ධිකාරක,
ශ්‍රී ලංකා කාර්මික පුහුණු ආයතනය,
දියගල ළමා නගරය,
රාගම.

දුරකථන අංකය : 0114-817525/0715-331817.

11-162

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයෙහි තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2014/2015

1.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්‍ෂිත තනතුරු :

වගුව - අංක 01

අනු. අංකය	තනතුරු නාමය	පිරවීමට තිබෙන පුරප්පාඩු ගණන	බඳවා ගන්නා ශ්‍රේණිය
1.	සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්‍ෂක	13	පුහුණු වන ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)
2.	පස් සමීක්‍ෂක	06	පුහුණු වන ශ්‍රේණිය (දෙවසකර පුහුණුව සඳහා)
3.	ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර	09	පුහුණු වන ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)
4.	විදුම් සහකාර	02	පුහුණු වන ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)
5.	යාන්ත්‍රික මූලික	13	III වන ශ්‍රේණියට බඳවා ගැනේ. එහෙත් බඳවා ගැනීමෙන් අනතුරුව මුල මාස 06 තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපලක සේවාස්ථ පුහුණුවක් ලබා දෙනු ලැබේ.
6.	සැලසුම් ශිල්පී	52	පුහුණු වන ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා)

1.2 *තනතුරුවල රාජකාරි ස්වභාවය :*

වගුව - අංක 02

අනු. අංකය	*තනතුරු නාමය*	*පැවරෙන කාර්යයන්*
1.	සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂණ කටයුතු කිරීම, එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පාලන කටයුතුවල (පස් සහ කොන්ක්‍රීට් ද්‍රව්‍යයන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබඳ) නිරතවීම හා එම ප්‍රමිතීන් සහතික කිරීම. රාජ්‍ය හා පුද්ගලික ආයතනවල ඉල්ලීම මත කෙරෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණ කටයුතුවල නිරතවීම.
2.	පස් සමීක්ෂක	01. දැනට කෙරෙමින් පවතින හා ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වාරිමාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘතින්හි මෙම අංශය මගින් සිදු කරනු ලබන පස් සමීක්ෂණ කටයුතු ඉඩම් පරිහරණ කටයුතු සඳහා අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත හා අනෙකුත් දත්ත ලබා ගැනීම සහ අන්තර්ජාතික වර්ගීකරණයට අනුකූලව එක් එක් පස් වර්ග වර්ගීකරණය කිරීම. 02. පස නිර්මාණය වීමේ සාධක (දේශගුණය, භූ විෂමතාවය, භූ විද්‍යාත්මක කරුණු යනාදිය) සැලකිල්ලට ගනිමින් ඒ ඒ පාංශු ගණ හෝ ශ්‍රේණිවල පිහිටීම හා පැතිරීම තීරණය කිරීම. 03. අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව පාංශු පැතිකඩයන්හි සවිස්තරාත්මක සටහනක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන පරිද්දෙන් පාංශු නියැදි ලබාගැනීම. එම පාංශු නියැදි විශ්ලේෂණය සඳහා රසායනාගාරයට භාරදීම, එම විශ්ලේෂණ දත්ත හා ක්ෂේත්‍ර නිරීක්ෂණ දත්ත පදනම් කරගනිමින් අවසාන පාංශු සිතියම්හි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සහ පාංශු යතුර පිළියෙල කර ගැනීම. 04. අදාළ ප්‍රදේශවල ගුවන් ඡායාරූප ත්‍රිමානේක්ෂය උපයෝගී කරගනිමින් ගුවන් ඡායාරූප විශ්ලේෂණය කිරීම. 05. දත්ත අවශ්‍ය වන තීව්‍රතාවය අනුව පාංශු සමීක්ෂණ කටයුතු සිදු කර ක්ෂේත්‍ර දත්ත, ලබා ගැනීම, පස් පැතිකඩ අනුව පස් වර්ග හඳුනාගැනීම. 06. ක්ෂේත්‍රයේදී ලබාගන්නාවූ නිරීක්ෂණ දත්ත මත දළ පාංශු සිතියම (Draft Soil Map) පිළියෙල කිරීම සහ පෙන්ටොග්‍රාෆ් යන්ත්‍රය භාවිත කරමින් අවශ්‍ය පරිමාණයට සකස් කිරීම. 07. ක්ෂේත්‍රයේදී ලබාගන්නාවූ නිරීක්ෂණ දත්ත හා අන්තර්ජාලය උපයෝගී කරගෙන ඉඩම් පරිහරණ සිතියම් පිළියෙල කිරීම. 08. ජීපීඑස් (ජී. පී. එස්. - Global Position System) උපකරණ මඟින් දත්ත ලබාගැනීම. 09. පසේ ජල සන්නායකතාව පිළිබඳ දත්ත ලබාගැනීම. 10. ක්ෂේත්‍රයේදී ක්ෂේත්‍ර කම්කරු මුරකරු සහ රියදුරන්ගේ පාලන කටයුතු (අධීක්ෂණ කටයුතු) සිදු කිරීම සහ ඔවුන්ගේ මූල්‍යමය රාජකාරී කටයුතු සෘජුවම සිදු කිරීම.
3.	ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර	ජල විද්‍යා අංශය මඟින් තෝරා ගත් ගංගා නිම්න සඳහා ජල විද්‍යා ක්ෂේත්‍ර මිනුම් ඒකක පවත්වා ගෙන යාම හා අවශ්‍ය වන කාලගුණ දත්ත, වර්ෂාපතනය, ගංගාවල ගලා යන ජල මට්ටම් සහ අවට ඇති වැව්වල ජල ධාරිතාවන්හි වෙනස්වීම් ආදිය පිළිබඳ දත්ත එක් රැස් කිරීම. * එසේ ලබා ගන්නා ලද සියලුම ජල විද්‍යා හා කාලගුණ දත්ත පරීක්ෂා කර ලේඛන ගත කිරීම සඳහා මාසය අවසානයේදී ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම. * ගංගාවල හා අතු ගංගාවල එම ජල මට්ටම් පවතින අවස්ථාවලදී ගලා යන ජල ධාරිතාවය මිනුම් ගැනීම. ගංවතුර අනතුරක් ඇති විය හැකි අවස්ථාවලදී හෝ ඊට ආසන්න අවස්ථාවේදී ඒ සඳහා අනතුරු ඇඟවීම අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත නිරතුරුවම ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම, ප්‍රධාන ගංවතුර අවස්ථාවලදී එම වේලාවන් සමඟ ගංවතුර මට්ටම් වෙනස්වීම් සටහන් කර ගැනීම.

අනු. අංකය	තනතුරු නාමය	පැවරෙන කාර්යයන්
4.	විදුලි සහකාර	* මධ්‍යම හා මහා පරිමාණ ඉදිකිරීම් සඳහා භූමියේ ශක්තිමත්භාවය භූගත ජල කාන්දුවීම් ආදිය පරීක්ෂා කිරීමේ කටයුතු. * විශාල ඉදිකිරීම්වල අත්තිවාරම් සඳහා විවිධ ගැඹුරු මට්ටම්වලින් පාෂාණ හා පස් තට්ටුවල සාම්පල ලබා ගැනීම. * පාෂාණ ස්ථරවල කාන්දුවීම නැවැත්වීම හා ඒවා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම. * නිම කරන ලද ඉදිකිරීම්වල සිමෙන්ති හා රසායනික ද්‍රව්‍ය කාවැද්දීම මගින් ද මතුපිට යන්ත්‍ර මගින් කොන්ක්‍රීට් ආස්තරණ යෙදීම මගින් ද ජල කාන්දුවීම හා වෙනත් දුර්වලතාවලට පිළියම් යොදා ශක්තිමත් කිරීමේ කටයුතු කිරීම. * ඉහත කාර්යයන්ට අදාළ වාර්තා ඉදිරිපත් කිරීම. ඉහත කාර්යයන්ට අවශ්‍ය වන විදුලි යන්ත්‍ර, ජල පොම්ප හා වෙනත් උපකරණ ද ඒවාට අදාළ ඩීසල් හා පෙට්‍රල් යන්ත්‍ර ක්‍රියාකරවීම, නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම.
5.	යාන්ත්‍රික මූලික	සුළු සේවකයන් පාලනය කිරීමේදී සහ රථ වාහන, යන්ත්‍ර ආදිය සඳහා ලඳුපත් පිළියෙල කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහය වීම, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ වැඩ ලිපිකරු සමඟ වැඩ ආරම්භ කිරීම, ගබඩා භාරකරු නොමැති අවස්ථාවලදී අළුත්වැඩියාව සඳහා පැමිණෙන අයිතමයන් තමන් භාරයට ගැනීම, අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් ආයුධ සහ ද්‍රව්‍ය ආදිය ලබා ගැනීම, ගබඩා පොත් නඩත්තු කිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහය වීම, අළුත්වැඩියා කිරීමෙන් පසු නිසි පරිදි ආපසු භාරදීම සහ අබලි අමතර කොටස් ද්‍රව්‍ය සහ භාණ්ඩ ආපසු ගබඩාවට භාරදීම කරන ලද අළුත්වැඩියාවන් ලොග් පොත්වල ඇතුළත් කිරීම, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ පිරිවැය ලිපිකරු සමඟ මුළු පිරිවැය (බිල්පත්) පිළියෙල කිරීම, පාවිච්චි කරන ලද අමතර කොටස් ඉන්ධන ලිහිසි තෙල් සහ අනෙකුත් දේ වෙනුවෙන් ද්‍රව්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම. අළුත්වැඩියාවලට යාන්ත්‍රික වැඩපලට රැගෙන එන යන්ත්‍ර හා වාහන ගබඩා භාරකරුගෙන් යාන්ත්‍රික වැඩපලට භාරගෙන, අළුත්වැඩියාව නිම වීමෙන් පසු නැවත ගබඩා භාරකරු වෙත භාර දීම.
6.	සැලසුම් ශිල්පී	(1) ඉංජිනේරු කාර්ය මණ්ඩලය විසින් දෙනු ලබන නිර්මාණ සටහන්, මූලික පරාමිති, කෙටුම්පත් සටහන් ඇසුරෙන් විස්තරාත්මක සැලසුම්පත් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම : බිම් මැණුම් තලමිති මැණුම් ආශ්‍රයෙන් පිඹුරුපත්, සමෝච්ච රේඛා සිතියම්, දික්කඩ හරස්කඩ සැලැසුම්පත්, පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම, වාරිමාර්ග ව්‍යාපාරවල ඉඩම් කට්ටි කිරීමේ සැලසුම්පත් ඉඩම් පවරා ගැනීමේ සැලසුම්පත්, මෙහෙයුම් නඩත්තු සැලසුම්පත් ආදිය පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම. (2) ප්‍රමාණ ගණනය : ගාස්තු සඳහා මිල විශ්ලේෂණය : ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම. (3) වැඩ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම. වැඩ ඇස්තමේන්තු අනුසාරයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ පෝරම, උපලේඛනය පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම : වැඩ සඳහා ගෙවීම් කිරීමට අදාළ මිණුම් පොත්, ගෙවීම් බිල්පත්, අවසන් ගෙවීම් වාර්තා හා සැලසුම්පත් පරීක්ෂා කිරීම. (4) වාරිමාර්ග ව්‍යාපාරවල තාක්ෂණික මෙහෙයුම් හා මනා දත්ත පිළිබඳ ලේඛන නඩත්තු : ප්‍රගති වාර්තා/සටහන් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම. (5) සැලසුම්පත්, පිඹුරුපත් සහ අනෙකුත් සැලසුම් කාර්යාලීය ලේඛන, ද්‍රව්‍ය හා උපකරණවල භාරකාරත්වය හා නඩත්තුව. (6) විධායකය/කළමනාකරණය විසින් පවරනු ලබන අනෙකුත් සැලසුම් ශිල්පීය රාජකාරී

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප :*
වගුව - අංක 03

ශ්‍රේණිය	*වැටුප් පරිමාණය*	*ආරම්භක මාසික වැටුප*
පුහුණු කිරීමේ ශ්‍රේණිය (යාන්ත්‍රික මූලික තනතුර සඳහා අදාල නොවේ.)	නොමැත	1 වසර මාසිකව රු. 12,920 2 වසර මාසිකව රු. 13,040 * රා. ප. ච. 06/2006 (ii) හි 14 වන ඡේදයේ 09 වන විධිවිධානයන්ට යටත්ව
III ශ්‍රේණිය	මාසිකව රු. 15,005-4x180-6x 240-11 x 320 - 20 x 360 - රු. 27,885 (එම්එන් 3-2006ඒ)	රු. 15,005
II ශ්‍රේණිය	මාසිකව රු. 15,005 - 4 x 180 - 6x 240 - 11 x 320 - 20 x 360 රු. 27,885 (12 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ.) (එම්එන් 3-2006ඒ)	රු. 17,485
I ශ්‍රේණිය	මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240-11x 320-20x 360- රු. 27,885 (23 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ.) (එම්එන් 3-2006ඒ)	රු. 21,045
විශේෂ ශ්‍රේණිය	මාසිකව රු. 20,030-11 x 365 - 18 x 500 - රු. 33,045 (4 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ.) (එම්එන් 7-2006ඒ)	රු. 21,125

4.0 මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, මෙම තනතුරු සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ දුෂ්කර ප්‍රදේශවල පිහිටි වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩ බිම්වල, වනගත ප්‍රදේශවල, මිනුම් කඳවුරුවල, දුෂ්කර ප්‍රදේශවල පිහිටුවා ඇති ප්‍රාදේශීය පර්යේෂණාගාරවල අඛණ්ඩව සේවයේ යෙදීමට හැකියාව තිබිය යුතුය.

5.0 *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 30 වේ.

6.0 *සුදුසුකම් :*

6.1 අධ්‍යාපන සුදුසුකම්

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම;

සහ

(ආ)

(i) පස් සමීක්ෂක තනතුර සඳහා—
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ තවත් එක් විද්‍යා හෝ ගණිත විෂයක් සහිතව විද්‍යා විෂයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම.

(ii) සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක, ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර, විදුලි සහකාර, සැලසුම් ශිල්පී හා යාන්ත්‍රික මූලික යන තනතුරු සඳහා—

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ව්‍යවහාරික ගණිතය/ශුද්ධ ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව විද්‍යා විෂයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම.

* යාන්ත්‍රික මූලික තනතුර සඳහා ඉල්ලුම් කරන්නන් ඉහත 6.1 සුදුසුකම්වලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක්ද ලබා තිබිය යුතුය.

(i) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව,

හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව,

හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව ලබා තිබීම,

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,

හෝ

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම,

හෝ

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

* සැලසුම් ශිල්පී තනතුර සඳහා ඉල්ලුම් කරන්නන් ඉහත 6.1 සුදුසුකම්වලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ලබා තිබිය යුතුය.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබීම.

6.2 *කායික සුදුසුකම් :*

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6.3 *වෙනත් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii). අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.0 *සාවද්‍ය තොරතුරු සැපයීම :*

මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්‍ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්‍ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවාගත් පසුව වුවද අපේක්‍ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

8.0 *විභාග පරිපාටිය :*

විභාගය විෂයන් දෙකකින් යුත් ලිඛිත පරීක්‍ෂණයකි. මෙම විභාගය සිංහල සහ දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය	*කාලය*	*මුළු ලකුණු*	*සමත් ලකුණු*
1. බුද්ධි පරීක්‍ෂණය	පැය 01	100	40
2. විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය	පැය 03	100	40

8.1 *විෂය නිර්දේශය* :

1. බුද්ධි පරීක්‍ෂණය -

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
බුද්ධි පරීක්‍ෂණය	අපේක්‍ෂකයාගේ සිතීමේ තර්කානුකූල භාවයත් සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ.

2. විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය -

* පස් සමීක්‍ෂක තනතුර සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය	I කොටස (භෞතික විද්‍යාව) (*a*) ආලෝකය (*b*) තාපය (*c*) යන්ත්‍ර විද්‍යාව (*d*) විද්‍යුතය හා චුම්භකත්වය II කොටස (රසායන විද්‍යාව) (*a*) කාබනික රසායනය (*b*) ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණය (*c*) අකාබනික රසායනය (*d*) සාමාන්‍ය රසායන විද්‍යාව

* ජලවිද්‍යා ක්ෂේත්‍ර සහකාර තනතුර සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය	ඛණ්ඩාංක ජ්‍යාමිතිය, ගති විද්‍යාව, ස්ථිති විද්‍යාව, ත්‍රිකෝණමිතිය, ද්‍රවස්ථිති විද්‍යාව, සංඛ්‍යානය, යාන්ත්‍ර විද්‍යාව, ආලෝකය (වර්තනය සහ පරාවර්තනය පිළිබඳ නියමයන්) තාපය, ආද්‍රතාවය, විදුලිය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආදී විෂයන් පිළිබඳ දැනුම පරීක්‍ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

* සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්‍ෂක/විදුම් සහකාර තනතුරු සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය	වීජ ගණිතය, ජ්‍යාමිතිය, ත්‍රිකෝණමිතිය, ද්‍රව සහ ද්‍රවල භෞතික ගුණ, ද්‍රවස්ථිති විද්‍යාව, මිනුම් ඒකක, පරිමාණ සිතියම් කියවීම, විද්‍යාත්මක ගණනය කිරීම ආදී විෂයන් පිළිබඳ දැනුම පරීක්‍ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රය පිළියෙල කරනු ලැබේ.

* යාන්ත්‍රික මූලික තනතුර සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය	ඇඳීමේ මුලධර්ම පාවිච්චි කරගෙන දෙන ලද රූපසටහනක් අනුව යන්ත්‍රයක හෝ කොටසක හරස්කඩක් හෝ පෙර හෝ පසු පෙනීමක් ඇඳීම සහ භෞතික විද්‍යාව, යාන්ත්‍රික විද්‍යාව හා ව්‍යවහාරික ගණිතය යන විෂයන් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්‍ෂා කිරීම සඳහා ප්‍රශ්න පත්‍ර පිළියෙල කරනු ලැබේ.

* සැලසුම් ශිල්පී තනතුර සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය	දෙන ලද නිර්මිතයක ප්‍රමාණය ගණනය කිරීම සහ ඉදිකිරීම් ද්‍රව්‍යවල ගුණාත්මක ස්වභාවය පිළිබඳ දැනුම පරීක්‍ෂා කිරීම සහ ඇඳීමේ මුලධර්ම පාවිච්චි කර දෙන ලද සටහන් අනුව වස්තුවක හෝ කොටසක හරස්කඩක් සහ පෙර හෝ පසු පෙනුමක් ඇඳීම.

8.2 මෙම විභාගය 2014 දෙසැම්බර් මස කොළඹ නගරය තුළදී පමණක් පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීම පිළිබඳ අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්‍ෂ ජනරාල් සතු වන්නේ ය.

9.0 *බඳවා ගැනීමේ ක්‍රමය :*

9.1 වාරිමාර්ග අධ්‍යක්‍ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්‍ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්‍ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

9.2 සම්මුඛ පරීක්‍ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාවය හා සහතික පත්‍ර පරීක්‍ෂා කර බැලීම සඳහා පමණක් වන අතර, ලකුණු ලබා දෙනු නොලැබේ.

10.0 *බඳවා ගැනීම :*

පුහුණු වන ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් අදාළ පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

11.0 *අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :*

(අ) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍ර අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතුය. අංක 1.0 සිට 4.0 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 5.0 - 7.2 දක්වා ශීර්ෂ 02 පිටුවේ ද, අංක 7.3 සිට 10.0 දක්වා ශීර්ෂ 03 පිටුවේ ද, ඉතිරිය 04 වන පිටුවට ද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතු ය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මඟින් ද නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කල යුතු වේ.

(ඇ) එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

(ඉ) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ඊ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

11.1 තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

11.3 අයදුම්පත්‍රයේ අපේක්‍ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

12.0 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියළුම කරුණු පිළිබඳව අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්‍ෂ ජනරාල් සතු වන්නේ ය.

13.0 *අයදුම්පත්‍ර යොමු කිරීම :*

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2014 නොවැම්බර් මස 21 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
අංක 230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

14.0 *විභාගයට පෙනී සිටීම :*

විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු ය.

15.0 *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*

විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

සටහන.—මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවී ඇති නිවේදන අතර අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල මාධ්‍යය බල පැවැත්විය යුතු බව කරුණාවෙන් සලකන්න.

ඉංජි. හඳ්‍රා කමලදාස,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2014 ඔක්තෝබර් මස 23 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

ආදර්ශ අයදුම් පත්‍රය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි තනතුරුවලට බඳවා ගැනීම සඳහා
පවත්වනු ලබන
විවෘත තරග විභාගය - 2014/2015

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

1.0 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය:

සිංහල - 1
දෙමළ - 2

(අදාල කොටුව තුළ ලියන්න)

2.0 අයදුම් කරනු ලබන තනතුරු නාමය :————.
(එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.)

3.0 3.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(කැපිටල් ඉංග්‍රීසි අකුරින්) (උදා. PERERA A.B.C.)

3.2 සම්පූර්ණ නම :————.
(කැපිටල් ඉංග්‍රීසි අකුරින්)

3.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන් / දෙමළෙන්)

3.4 ජාතික හැඳුනුම්පත් අංකය :

3.5 ස්ත්‍රී / පුරුෂ භාවය (අදාල කොටුව තුළ ලියන්න)

පුරුෂ - M
ස්ත්‍රී - F

4.0 4.1 ස්ථිර ලිපිනය :————.
(කැපිටල් ඉංග්‍රීසි අකුරින්)

4.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන් / දෙමළෙන්)

4.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(කැපිටල් ඉංග්‍රීසි අකුරින්)

4.4 දුරකථන අංකය : ස්ථාවර :————.
ජංගම :————.

5.0 පදිංචිය :

5.1 පදිංචි දිස්ත්‍රික්කය :————.
5.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :————.

6.0 6.1 විවාහක/ අවිවාහක බව :

අවිවාහක - 1 විවාහක - 2 ☐

6.2 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

6.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට (2014.11.21) වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

7.0 අධ්‍යාපන සුදුසුකම් :

7.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :

පළමුවර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

විෂය	ශ්‍රේණිය	විෂය	ශ්‍රේණිය
1.		6.	
2.		7.	
3.		8.	
4.		9.	
5.		10.	

7.2 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :

දෙවනවර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :

විෂය	ශ්‍රේණිය	විෂය	ශ්‍රේණිය
1.		6.	
2.		7.	
3.		8.	
4.		9.	
5.		10.	

7.3 අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :

විෂය	ශ්‍රේණිය
1.	
2.	
3.	
4.	
5.	

8.0 වෘත්තීය සුදුසුකම් :

ආයතනය	හදාරා ඇති පාඨමාලාව	කාල සීමාව	සහතික පත් අංකය හා දිනය

9.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාල කොටුවේ x ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

9.1 'ඔව්' නම් විස්තර සඳහන් කරන්න. :————.

10.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා මෙම තනතුරට තෝරා පත් කර ගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම දුෂ්කර ප්‍රදේශයක වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩ බිම් වල, වනගත ප්‍රදේශවල, මිනුම් කඳවුරුවල, දුෂ්කර ප්‍රදේශ වල පිහිටුවා ඇති ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල, යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලවල, පර්යේෂණාගාරවල අඛණ්ඩව සති කීපයක් හෝ මාස කිහිපයක් රාජකාරි කිරීමට එකඟ වෙමි.

(ඇ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඉ). මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .... මයා/ මිය/ මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය .... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය:————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

.... මයා/ මිය/ මෙනවිය .... සේවයේ නියුතු .... තනතුර දරණ නිලධාරියෙකු බවත්, ඔහු/ ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ ඇය තෝරා ගනු ලැබුවහොත්,............ සේවයෙන් ඔහු/ ඇය මුදා හැරිය හැකි/ නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය :————.

11-180

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය -2014

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2015 පෙබරවාරි මස කොළඹදී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙමි.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1225/32 දරන 2002.03.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

විභාග පරිපාටිය :

(අ) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ.

විෂය අංකය	01	සාමාන්‍ය පරිපාලනය - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආයතන සංග්‍රහයේ විධිවිධාන රජයේ වෙනත් රෙගුලාසි
විෂය අංකය	02	මුදල්
විෂය අංකය	03	අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය

(ආ) නිලධාරියකුට I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් සඳහා එකම වතාවකදී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයකදී හෝ පෙනී සිටිය හැකිය.

(ඇ) සෑම ප්‍රශ්න පත්‍රයකට ම කාලය පැය 03 යි.

03. *විෂය නිර්දේශය :*

(01) *සාමාන්‍ය පරිපාලනය :*

(අ) ලංකා (ආණ්ඩුක්‍රම) රාජ ආඥාව 1946 හා 1947 (973 වන පරිච්ඡේදය)
1948 අංක 18 පුරවැසි පනත (349 වන පරිච්ඡේදය)
1972 මැයි 22 වැනි දින පනවා සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත
1981 අංක 19 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත
1981 අංක 07 දරන ජනමත විචාරණ පනත
1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනත
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(ආ) කාර්යාලයීය සහ ක්ෂේත්‍ර සංවිධානය සහ ක්‍රම
ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ රජයේ වෙනත් රෙගුලාසි
ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I, II. III, IV, V, VI, VII, IX, X, XI, XVI, XXV, XXVI, XXVII, XXIX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

(02) *මුදල්*

(අ) රජයේ මුදල් රෙගුලාසි 1 වන කොටස (1 වන පරිච්ඡේදය හැර)
(ආ) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් හා වැය ඇස්තමේන්තු උදා :- ඒවායේ සැකැස්ම, ආදායම් ශීර්ෂ, මුදල් හා විසර්ජන පනත්
(ඇ) අධ්‍යාපන කාර්යාල මගින් ඉටු කරනු ලබන නිශ්චිත ගිණුම් කටයුතුවලට අදාළවන ආඥා පනත් සහ වෙනත් නීති ප්‍රඥප්ති.

(03) *අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය :*

(අ) අධ්‍යාපන නීතිය - අපේක්ෂකයන් පහත සඳහන් ආඥා පනත් සහ පාර්ලිමේන්තු පනත් පිළිබඳ දැනුම හා අවබෝධය ලබා තිබිය යුතුය.

- 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත
- 1947 අංක 26 දරන සංශෝධන ආඥාපනත
- 1951 අංක 05 දරන සංශෝධනපනත
- 1953 අංක 43 දරන සංශෝධන පනත
- රජයේ පාසල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය
- 1960 අංක 05 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධි විධාන සංශෝධන) පනත
- 1961 අංක 08 දරන උපකෘත පාසල් හා ගුරු විද්‍යාල (අතිරේක විධි විධාන) පනත
- 1973 අංක 35 දරන අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත
- 1979 අංක 64 දරන පිරිවෙන් පනත
- 1981 අංක 65 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධි විධාන - සංශෝධන පනත)
- 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත

(ආ) අධ්‍යාපන පරිපාලනය :

(1) අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති
(i). අධ්‍යාපන අමාත්‍යාංශය,
(ii) දිස්ත්‍රික් දෙපාර්තමේන්තු ද ඇතුළු'ව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ආයතනවල සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධානය හා කාර්යයන්
(iii) ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙන් අධ්‍යාපනික සැලසුම් කිරීම, පරමාර්ථ, ක්‍රම (පාසල් සැකසුම් ඇතුළු'ව) ක්‍රියාත්මක කිරීම යනාදිය
(2) පාසල් කළමනාකරණය, පාසල් ප්‍රජා සම්බන්ධතා
(3) අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය
(4) විශේෂ අධ්‍යාපන වැඩසටහන්

(ඇ) අධ්‍යාපන අධීක්ෂණය :

- පාසැල් අධීක්ෂණය සඳහා ක්‍රම හා ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා උපයෝගී කර ගන්නා උපමාන
- පාසල්වල අඛණ්ඩ ඇගයීම් වැඩසටහන්
- පාසල්වල ස්වයං ඇගයීම් වැඩසටහන්
- දිස්ත්‍රික්, දෙපාර්තමේන්තු සහ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් අධීක්ෂණය කිරීම
- බාහිර කණ්ඩායම් මගින් අභ්‍යන්තර ඇගයීම් සුපරීක්ෂණය

(අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ, අත්පොත් හා වෙනත් ප්‍රකාශන පිළිබඳ මනා අවබෝධයක් ඇති කර ගන්නා ලෙස අපේක්ෂකයන්ට උපදෙස් දෙනු ලැබේ.)

නිර්දේශිත ග්‍රන්ථ හා ප්‍රකාශන :

- අධ්‍යාපන සැලසුම් හා පරිපාලනය පිළිබඳ ආසියාතික ආයතන (1970)
- අධ්‍යාපන පරිපාලනය පිළිබඳ නව කළමනාකරණ ශිල්පීය ක්‍රම
- සම්මන්ත්‍රණයක වාර්තාවක් - නවදිල්ලිය
- බැරි සහ ටයි (1975) පාසැලක් පවත්වාගෙන යාම ටෙම්පල් ස්මිත් ලන්ඩන්
- බුෂ් ටී ග්ලැටර් ආර්. ගුඩ් සහ සී. රිවස් (1980) පාසැල්
- කළමනාකරණ විධි, හාර්පර් සහ රෝ
- ආචාර්ය කාන් මොහිදීන් ෂෙරීෆ් 1983
- පාසල් පරිපාලනය - නවදිල්ලිය
- අධ්‍යාපන අමාත්‍යාංශය ලංකාවේ අධ්‍යාපනය (1969)
- අධ්‍යාපන හා සංස්කෘතික වැඩ කටයුතු අමාත්‍යාංශයේ ශත සංවත්සරික කාණ්ඩය II වන හා III වන කොටස්
- විවෘත විශ්ව විද්‍යාලය (1981) පාසල්වල ප්‍රතිපත්ති සම්පාදනය සංවිධානය හා නායකත්වය (ඊ 323 පාඨමාලාවේ 4 වන කොටස) විවෘත විශ්ව විද්‍යාලය, යුනිවර්සිටි ප්‍රෙස්, ලන්ඩන් , ෂිප්මන්, මර්ටන් (1983) පාසලෙහිම ඇගයීම හයිස්මන් අධ්‍යාපන පොත් ලන්ඩන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ වාර්තාව - 1984

04. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා හිමි ලකුණු ප්‍රමාණය 100 කි. සාමාර්ථ්‍යය සඳහා එක් එක් විෂයට 40% හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතුය.

05. *විභාගයේ භාෂා මාධ්‍යය :*

(i) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

(ii) අපේක්ෂකයින්ට රාජ්‍ය භාෂාව හෝ ජාතික භාෂාව හෝ යන එක් භාෂා මාධ්‍යයකින් පිළිතුරු ලිවිය හැක.

(iii) අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීමට පෙර පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍යය හෝ තරග විභාගයක් නොමැතිව රජයේ සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

06. අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. ඉල්ලුම්පත්‍ර පහත දැක්වෙන ආකෘතියට අනුව A-4 ප්‍රමාණයේ කඩදාසියක ඉදිරිපත් කළ යුතුය. (අයදුම්පතෙහි අංක 01 සිට 06 තෙක් ඡේදයන් පළමු වන පිටුවෙහිත් ඉතිරිය දෙවන පිටුවෙහිත් සඳහන් කරන්න.) සිංහල අයදුම්පත්‍රයේ විභාගයේ නම සිංහලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයැදුම්පත්‍රයේ විභාගයේ නම දෙමළට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුය. අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක්

ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බව ද සලකන්න.

08. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

09. ඉල්ලුම්පත්‍ර 2014.12.08 දිනට හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම ද සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2/3 ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී ඔබ ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ, මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ හා අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් යවා ලබාගත් කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් සමඟ ඔබගේ ඉල්ලීම් ලිපිය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායී වනු ඇත. ෆැක්ස් අංකය 011 - 2784232) ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් කරන්න.

(I) විභාගයේ නම :-
(II) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :-
(III) අපේක්ෂකයාගේ සම්පූර්ණ ලිපිනය :-
(IV) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය හා තැපැල් කාර්යාලය :-

11. ඉහත 09 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ.

12. (i) සෑම අපේක්ෂකයෙකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

(ii) විභාග ශාලාවේදී තමන්ගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම් වන අතර ඒ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදෙස් ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගැනේ.

13. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. අදාළ විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ එක් දාරයක් පමණක් සිටින සේ ඇලවීමට කටයුතු කරන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත).

(අ) පළමු වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.)

(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා-

සම්පූර්ණ විභාගය සඳහා	රු. 1000.00 යි
එක් විෂයයකට	රු. 500.00 යි

14.

(I) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(II) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

අනුර දිසානායක,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

බත්තරමුල්ල,
පැලවත්ත,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ඉල්ලුම් පත්‍රය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියේ නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014

FIRST EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN CLASS III OF THE SRI LANKA EDUCATION ADMINISTRATIVE SERVICE - 2014

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(විභාගයේ නම ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය)

01. (අ) මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
උදා:- GUNAWARDHANA, M.G.B.S.K.

(ආ) මුල්'කුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

02. ලිපිනය :

(i) රාජකාරි ලිපිනය :————.
(ii) පෞද්ගලික ලිපිනය :————.
(iii) විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):————.
(iv) දුරකථන අංකය :————.

03. නිවේදනයේ 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

විෂය අංකය :- ☐☐ විෂයය :-

විෂය අංකය :- ☐☐ විෂයය :-

විෂය අංකය :- ☐☐ විෂයය :-

04. ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐

05. උපන් දිනය :-

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

06. ස්ත්‍රී / පුරුෂ භාවය

පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. (1) පදවි නාමය :————.

(11) දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය/ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය/පාසැල :————.

08. මෙම විභාගයට කලින් සම්පූර්ණයෙන් හෝ කොටසකට හෝ පෙනී සිටියේ නම් එසේ පෙනී සිටි වර්ෂය විෂය හා මාධ්‍යය සඳහන් කරන්න.

වර්ෂය	*විෂයය*	*මාධ්‍යය*
....	....	....
....	....	....
....	....	....

09. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :-
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

මුදල් ගෙවා ලදුපත මෙහි අලවන්න. (ඡායා පිටපතක් ළග තබා ගන්න. අදාළ නම් පමණි)

10. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, අයදුම්පත්‍රයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාගය සම්බන්ධයෙන් වන සියලුම නීති රීතිවලට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————.
අපේක්ෂකයාගේ අත්සන

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට /අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, අයදුම්පත්‍රයේ ඔහු/ඇය විසින් සඳහන් කර ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටිමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

මුදල් ගෙවූ ලදුපත ඉහත අලවා ඇති බව ද ප්‍රකාශ කරමි (★)

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
පදවි නාමය සහ නිල මුද්‍රාව

දිනය :————.

(★) ගාස්තු ගෙවීමට අවශ්‍ය නොවේ නම් කපා හරින්න.

11-325

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

	රු. ශ.
අඟලකට හෝ ඉන් අඩුව	137 0
වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට	137 0
තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට	1,300 0
තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට	2,600 0

(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

	වාර්ෂික දායක මුදල	*තැපැල් ගාස්තුව*
	රු. ශ.	*රු. ශ.*
I වැනි කොටස :		
I වැනි ඡේදය	4,160 0	9,340 0
II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය)	580 0	950 0
III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය)	405 0	750 0
I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව)	890 0	2,500 0
II වැනි කොටස (අධිකරණ)	860 0	450 0
III වැනි කොටස (ඉඩම්)	260 0	275 0
IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ...	2,080 0	4,360 0
V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය)	1,300 0	3,640 0
VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ...	780 0	1,250 0
අති විශෙෂ ගැසට් පත්‍රය...	5,145 0	5,520 0

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

	පිටපතක මිල	තැපැල් ගාස්තුව
I වැනි කොටස :	*රු. ශ.*	*රු. ශ.*
I වැනි ඡේදය	40 00	60 0
II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය)	25 00	60 0
III වැනි ඡේදය	15 00	60 0
I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව)	80 0	120 0
II වැනි කොටස	12 0	60 0
III වැනි කොටස	12 0	60 0
IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්)	23 0	60 0
V වැනි කොටස	123 0	60 0
VI වැනි කොටස	87 0	60 0

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.

සැළකිය යුතුයි. - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

උපලේඛනය

මාසය	*පළ කිරීමේ දිනය*		*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව*			
			2014			
නොවැම්බර්	2014.11.07	සිකුරාදා	2014.10.24	සිකුරාදා	දහවල්	12.00
	2014.11.14	සිකුරාදා	2014.10.31	සිකුරාදා	දහවල්	12.00
	2014.11.21	සිකුරාදා	2014.11.07	සිකුරාදා	දහවල්	12.00
	2014.11.28	සිකුරාදා	2014.11.14	සිකුරාදා	දහවල්	12.00
දෙසැම්බර්	2014.12.05	සිකුරාදා	2014.11.21	සිකුරාදා	දහවල්	12.00
	2014.12.12	සිකුරාදා	2014.11.28	සිකුරාදා	දහවල්	12.00
	2014.12.19	සිකුරාදා	2014.12.05	සිකුරාදා	දහවල්	12.00
	2014.12.26	සිකුරාදා	2014.12.12	සිකුරාදා	දහවල්	12.00
			2015			
ජනවාරි	2015.01.02	සිකුරාදා	2014.12.19	සිකුරාදා	දහවල්	12.00
	2015.01.09	සිකුරාදා	2014.12.26	සිකුරාදා	දහවල්	12.00
	2015.01.16	සිකුරාදා	2014.01.02	සිකුරාදා	දහවල්	12.00
	2015.01.23	සිකුරාදා	2014.01.09	සිකුරාදා	දහවල්	12.00
	2015.01.30	සිකුරාදා	2014.01.16	සිකුරාදා	දහවල්	12.00

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.